**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

## අන්තර්මධ්‍ය විභාගය - ජූලි 2014

(56) ව්‍යාපාර නීතිය හා කළමනාකරණය

විෂයයේ

## කළමනාකරණය

(Management)

---

**ප්‍රශ්න අංක 01** - ලකුණු 10

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** සංවිධානවලට, හොඳ කළමණාකරණයක්, අවශ්‍ය වන්නේ ඇයිදැයි යන්නට හේතු දෙකක්(02) සඳහන් කිරීමට තිබුනි. හැම අයදුම්කරුවකුම හේතු සඳහන් කරමින් සාර්ථකව පිළිතුරු සපයා ලකුණු උපයා තිබුනි.

**(b)** සාර්ව පාරිසරික බලවේග දෙකක්(02) සඳහන් කර සංවිධානමය කාර්යසාධනය කෙරෙහි ඒවා බලපෑම සිදුකරන්නේ කෙසේද පැහැදිලි කිරීමට තිබුනි.

ඇතැම් අයදුම්කරුවන් සාර්ව පාරිසරික බලවේග වන දේශපාලනමය කරුණු, ආර්ථික කරුණු, සාමාජීය කරුණු, තාක්ෂණික කරුණු, ස්වාභාවික කරුණු වෙනුවට තරඟකරුවන්, රජයේ සැපයුම්කරුවන් වැනි දේ ලියා තිබුණි.

ඇතැම් අයදුම්කරුවන් සාර්ව පාරිසරික බලවේග සඳහන්කර තිබුනත් ඒවා බලපෑම් කරන ආකාරය පැහැදිලි කිරීමේදී නිවැරදිව කර නොතිබුනි.

මෙම අඩුපාඩු සකස් කර ගැනීම සඳහා පරිසරාත්මක සාධක පිළිබඳ මූලික අවබෝධයක් ලැබෙන අයුරින් අධ්‍යයන කටයුතු කරගත යුතුවේ.

**(C)** වර්තමානයේ සංවිධානයක කළමනාකරුවන් විසින් මුහුණදෙන අභියෝග හතරක් (04) කෙටියෙන් පැහැදිලි කිරීමට තිබුනි. මෙම කොටසට බොහෝදෙනකු සාර්ථකව පිළිතුරු දී නැත. අඩුපාඩු ලෙස පහත දැක්වෙන කරුණු පෙන්වාදිය හැකිය.

- SWOT (ශදුඅත) විශ්ලේෂණය ඉදිරිපත් කර තිබීම.
- කළමණාකරණ කාර්යයන් එනම් සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම සහ පාලනය අභියෝග ලෙස සලකා විස්තර කර තිබීම.

සේවකයන් විවිධාකාරවීම, සීඝ්‍රයෙන් වෙනස්වන සාර්ව පාරිසරික බලවේග, ගනුදෙනුකරුවන්ගේ කේවෙල් කිරීමේ බලය, භාණ්ඩ හිඟය පිළිබඳ ප්‍රශ්ණය, පාර්ශවකරුවන් සතුටට පත්කිරීම, නිවැරදි ව්‍යාපාරික ප්‍රමුඛතා හඳුනා ගැනීම යනාදී කරුණු ලියා තිබුණේ අපේක්ෂකයන් කිහිප දෙනෙකු පමණි.

මේවා ගැන කරුණ රැස්කර ගැනීම ඉතා වැදගත් සේ සැලකේ.

## ප්‍රශ්න අංක 02 - ලකුණු 10
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) තීරණ ගැනීම, යන්නෙන් අදහස් කරන දේ විමසා තිබුනි. ප්‍රශ්නයක් විසඳීම සඳහා ඇති විකල්ප පිළිතුරු අතරින් ගැලපෙන විකල්පය තෝරා ගැනීම යන කරුණු සාර්ථක ලෙස සඳහන් කරමින් ලකුණු උපයාගෙන තිබුනි.

(b) සැලසුමක ඇති ප්‍රධාන මූලිකාංග තුනක් (03) ක් කෙටියෙන් විස්තර කිරීමට තිබුනි.

ප්‍රධාන මූලිකාංග වන දැක්ම, මෙහෙවර, පරිසර විශ්ලේෂණය, සංයුක්ත පරමාර්ථ/ උපායශීලී අරමුණු, උපාය මාර්ග, අරමුණු යන ඒවායෙන් 03 ක් ලියා තිබුන නමුත් ඒවා කෙටියෙන් පැහැදිලි කිරීම දුර්වල තත්වයක තිබුනි. මෙම දුර්වලතාවය මග හරවා ගැනීමට ඉහත කරුණු ගැන දැන ගැනීමට උනන්දු විය යුතුයි.

(c) නිලතන්ත්‍රවාදය / නිලබලවාදය යන සංකල්පය පැහැදිලි කිරීමට තිබුනි. මේ සංකල්පය පිළිබඳ දැනුම ඉතාම අඩු බව පෙනේ. මෙම කොටසට ඉතා අඩු සංඛ්‍යාවක් පිළිතුරු සපයා තිබුනු අතර පිළිතුරු දුන් අයදුම්කරුවන්ද වැරදි පිළිතුරු ඉදිරිපත් කර තිබුනි. මෙම අඩුපාඩුව මගහරවා ගැනීමට නිලතන්ත්‍රවාදය යන මාතෘකාව මුල සිටම හදාරා අවබෝධකර ගත යුතුව තිබේ.

## ප්‍රශ්න අංක 03 - ලකුණු 10
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) අණදීමේ / විධාන දීමේ ඒකීයත්වය, යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න විමසා තිබුනි.

කාර්යයන් ඉටුකිරීමේදී එක් සේවකයෙකු විධාන ලැබිය යුත්තේ එක් අධීක්ෂකයෙකුගෙන් පමණක් යන්න පිළිතුර විය. එහෙත් බොහෝ අයදුම්කරුවන් මෙම අදහස නොලියා අපැහැදිලි වෙනත් කරුණු සඳහන් කර තිබුනි.

(b) පාලනවිතස්ථිය / පාලන අවකාශය නිර්වචනය කොට එහි ප්‍රමාණය කෙරෙහි බලපෑම් කරන සාධක දෙකක් (02) සඳහන් කරන්න.

පාලනවිතස්ථිය / පාලන අවකාශය යනු එක් කළමනාකරුවකු වෙත වාර්තා කරන සේවක සංඛ්‍යාව යන්න ඇතැම් අයදුම්කරුවන් ලියා තිබුනත් පාලන විතස්ථි ප්‍රමාණය කෙරෙහි බලපාන සාධක ලියා නොතිබුනි.

(c) අධිකාරිය හා බලය අතර වෙනස පැහැදිලි කිරීමට තිබුනි.

අධිකාරිය හා බලය යන කාරණා ගැන හරිහැටි අවබෝධයක් නොමැත. වැරදි සහිත කරුණු ලියා තිබුනි. මාතෘකා මුල සිටම හැදෑරීමේ අවශ්‍යතාවය පෙනුනි.

## ප්‍රශ්න අංක 04 - ලකුණු 10
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** නායකත්වය යන පදය නිර්වචනය කිරීමට තිබුනු අතර සියළුම අපේක්ෂකයින් නිවැරදිව නිර්වචන ඉදිරිපත් කර අදාල ලකුණු 02 උපයාගෙන තිබුනි.

**(b)** මානව සම්පත් අනෙකුත් සම්පත් වලින් වෙනස්වන ආකාරය විමසා තිබූ අතර ඉතා සාර්ථක ලෙස ලියා ලකුණු උපයාගෙන තිබුනි.

**(c)** ගිණුම් ලිපිකරුවකු බඳවා ගැනීම හා තෝරා ගැනීමට අදාළ ක්‍රියාවලිය විස්තර කිරීමට තිබුනි. මෙම ප්‍රශ්නයට අදාළව වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් සාර්ථකව පිළිතුරු සපයා තිබුනි. එහෙත් පොදු දුර්වලකමක් ලෙස තිබුනේ එකම කරුන වෙනත් වචන වලින් නැවත නැවත ලිවීමයි.

එකම කරුණු නැවත වෙනස් විදියකට ලිවීමෙන් ලකුණු උපයාගත නොහැකි බව අයදුම්කරුවන් තේරුම්ගත යුතු වේ.

## ප්‍රශ්න අංක 05 - ලකුණු 10
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** සංනිවේදනය යන පදය නර්වචනය කිරීමට තිබුනි. ඉතා සාර්ථක නිර්වචන ඉදිරිපත් කොට සියළුම අපේක්ෂකයින්ම වාගේ ලකුණු උපයාගෙන තිබුනි.

**(b)** සඵලදායී සංනිවේදනය සඳහා ඇති බාධක 02ක් සඳහන් කිරීමට තිබූ අතර ඒවා සාර්ථකව ලියා ලකුණු උපයාගෙන තිබුනි.

**(c)** සංවිධානයක අලෙවි කළමනාකරුවකුගේ ප්‍රධාන කාර්යයන් 03 ලිවීමට තිබුනි.
අලෙවි කළමනාකරුවකුගේ ප්‍රධාන කාර්යයන් ගැන වැටහීමක් නැතිව අලෙවියට සම්බන්ධ මොනවා හෝ ලියා ඉදිරිපත් කිරීමට උත්සාහ කර තිබුනි.

1. අලෙවි පර්යේෂණ
2. නිශ්පාදිත නිර්මාණ සැලසුම්කරණය
3. නිෂ්පාදිත වල හරි වැරදි පරීක්ෂාව
4. අලෙවිකරණ සැලසුම් කිරීම
5. අලෙවි මිශ්‍ර පිළිබඳ තීරණ
6. ගනුදෙනුකරුවන් හා සම්බන්ධ කළමනාකරණය
7. අලෙවි පාලනය

යනාදී කරුණු ලියා නොතිබුණි.

## ප්‍රශ්න අංක **06** - ලකුණු 10
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** හොඳ ලිපිගොනු පද්ධතියක් පවත්වා ගැනීමේ වාසි 03 ක් සඳහන් කිරීමට තිබුණි.

වැඩි අයදුම්කරුවන් ප්‍රමාණයක් නිවැරදි කරුණු ලියා ලකුණු උපයා ගැනීමට සමත් වුවත් ඇතැම් අයදුම්කරුවන් එකම කරුණ වෙනත් වචන වලින් ලියා අළුත් කරුණු සේ පෙන්වීමට උත්සාහ කර තිබුණි.

**(b)** සාම්ප්‍රදායික කාර්යාලයක්, සමග සසඳා බලන විට, නූතන කාර්යාලයක, ප්‍රධාන ලක්ෂණ 03 ක් විස්තර කරන්න.

ලකුණු ඉපයීම උසස් මට්ටමක නොවීය. බොහෝ අයදුම්කරුවන් නූතන කාර්යාල වල පරිඝණක භාවිතය ගැන නැවත නැවත ලියා තිබුණි.

අපේක්ෂිත ප්‍රතිඵල වූයේ:

1. කඩදාසි රහිත බව
2. තොරතුරු තාක්ෂණයේ බුද්ධිමත්භාවය
3. විද්‍යුත් ක්‍රියාකාරී කාර්යාලීය උපකරණ හා මෙවලම්
4. අඩු මානව සම්පත්
5. විද්‍යුත් ගනුදෙනු
6. කුඩා කාර්යාල ඉඩකඩ

යනාදියයි.

**(c)** සඵලදායී පාලන පද්ධතියක අඩංගු වියයුතු ලක්ෂණ 04 ක් කෙටියෙන් පැහැදිලි කිරීමට තිබුණි.

වැඩි අයදුම්කරුවන් ප්‍රමාණයක් ප්‍රශ්නය තේරුම් නොගෙන අදාල නොවන පිළිතුරු ඉදිරිපත් කර තිබුණි. කළමනාකරණ කාර්යයන් වන සැලසුම්කරණය, සංවිධානකරණය, මෙහෙයවීම හා පාලනය විස්තර කර තිබූ අතර ශ්‍රම විභජනය වැනි කරුණු ද ලියූ අයදුම්කරුවන් විය.

මෙම දුර්වලතාවයෙන් මිදීමට <u>සඵලදායී පාලන පද්ධතිය</u> යන්න නිවැරදිව වටහා ගත යුතුව තිබුණි.
එවිට නිවැරදි පිළිතුර වන්නේ:

- නිවැරදි තොරතුරු ජනනය කිරීමේ හැකියාව
- කාලීන තොරතුරු සැපයීමේ හැකියාව
- පිරිවැය සඵලතාවය
- නම්‍යතාවය
- සේවකයන් අවබෝධ කර ගැනීම
- කළමනාකරණ ශෛලීය පිළිබිඹු වීම.

යනාදියයි.

සමස්තයක් ලෙස ගත් කල පිළිතුරු සැපයීම සාර්ථක බව පැහැදිලි විය. ආයතනයේ පෙළපොත පරිශීලනය, විධිමත් ලෙස කරුණු ඉදිරිපත් කිරීම, අනවශ්‍යදේ ලිවීම අඩු කිරීම යනාදිය කෙරෙහි අයදුම්කරුවන් අවධානය යොමු කල යුතු වේ.

\- - -

## <u>සැලකිය යුතු පොදු කරුණු:</u>

(1) සමස්ථයක් ලෙස ගත් කළ පිළිතුරු සැපයීම සාර්ථක යැයි සැලකිය හැක. කළමනාකරණය ප්‍රශ්න පත්‍රය අයදුම්කරුවන්ට පිළිතුරු සැපයීමට අපහසු එකක් නොවුවත් ලකුණු දීමේදී අඩු ලකුණු ලබා ගැනීමට හේතු වී ඇත්තේ බොහෝවිට අසන ප්‍රශ්නයට නිවැරදි පිළිතුර නොව තමා දන්නා විෂය කරුණු සියල්ල ඉදිරිපත් කිරීම ය. බොහෝවිට විෂය කරුණු පිළිබඳව දැනුම තිබුණද පිළිතුරු ලිවීමේ අභ්‍යාස වල නොයෙදීම නිසා අයදුම්කරුවන්ට අඩු ලකුණු ලබා ගැනීමට සිදුවිය. එයට හේතු වන්නේ **බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රය අතට ගත්විට ප්‍රශ්නය හොඳින් කියවා තේරුම් නොගෙන අනවශ්‍ය දේ ලිවීමට පෙළඹෙන අතර වටිනා කාලයද අපතේ යවනු ඇත.**

(2) ප්‍රශ්න අංක යෙදීම, ප්‍රශ්නයේ කොටස් සඳහා වෙන වෙනම පිළිතුරු පැහැදිලිව ඉදිරිපත් කිරීම, පිළිතුරු පොතේ මුල් පිටුවේ ඇති **"අයදුම්කරුවන්ට උපදෙස්"** හොඳින් කියවා පිළිපැදීම යන කරුණු වැදගත් බව සලකන්න.

(3) තවද විභාගයට පෙර පසුගිය ප්‍රශ්න පත්‍රවලට නිශ්චිත කාලයක් තුල පිළිතුරු සපයා පෙර පුහුණුවක් ලබා ගැනීම ඉතා වැදගත්ය.

(4) ඒඒටී ආයතනයෙන් නිකුත් කර ඇති <u>**ස්වඅධ්‍යයන පාඩම් මාලාව**</u> පොත පරිශීලනය කිරීම වැදගත් වේ.

- * * * -